PERMANENT
REFERENCE
NOT TO BE
REMOVED
FROM THE
LIBRARY

(21)

# ශ්‍රී ලංකාවේ
# කනිෂ්ඨ ද්විතීයික මට්ටමේ
# විෂය මාලා සංවර්ධන ප්‍රයත්නයන් පිළිබඳ
# විමර්ශනාත්මක අධ්‍යයනයක්

අධ්‍යාපන දර්ශනපති උපාධිය

එම්.ඩබ්ලිව්.ඩබ්ලිව්.දිසානායක
බී.ඒ. ගෞරව (ලංකා),
අධ්‍යාපන ඩිප්ලෝමා (ලංකා)

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
කොළඹ-3

UNIVERSITY OF COLOMBO SRI LANKA
LIBRARY

1980-12-15

UCLIB
375744

## - සංක්ෂෙපයෙන් -

කාලාන්තරයක් තිස්සේ පරිභෝජන ක්‍රියාවලියක් වශයෙන් පැවති අධ්‍යාපනය, ආයෝජන ක්‍රියාවලියක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා බොහෝ රටවල්, විශේෂයෙන් තුන්වන ලෝකයේ රටවල් නොනිමි අරගලයක යෙදී සිටීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිවිප්ලවයකට තුඩු දී ඇත. මෙහි මුල්තැන ගෙන ඇත්තේ විෂය මාලාව ය. ගතානුගතික හා ඓතිහාසික පරිණාමයට ඉඩ දෙනු වෙනුවට, විද්‍යා හා තාක්ෂණික ප්‍රගතියට මුහුණ දිය හැකි මිනිස් පරපුරක් ගොඩනඟා ගැනීම සඳහා ද සංවර්ධන සංකල්පය සාක්ෂාත් කර ගැනීම පිණිස මිනිස් බල සැලසුම්කරණය සඳහා ද, විෂය මාලාව සවිඥානකව සංවර්ධනය කරගැනීමේ ප්‍රයත්නයක මුළු මහත් ලෝකය ම නිරත ව සිටී. මෙවැනි යුගයක ශ්‍රී ලංකාව, විෂය මාලා සංවර්ධන ක්‍රියාවලියේ කෙබඳු මට්ටමක ට පැමිණ සිටින්නේදැයි විමසා බැලීමේ කාලෝචිත බව, මෙම අධ්‍යයනය සඳහා මා පෙළඹ වූ ප්‍රධානතම බලවේගය විය.

සවිඥානක විෂය මාලා සංවර්ධන කාර්යය පසුගිය දශක කීපයෙක සිට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව නැම්මක් ඇති කිරීමට සමත් වී ඇත. ප්‍රථමයෙන් ආනුභවික මට්ටමකින් ආරම්භ වූ මෙම කාර්යය, ක්‍රමයෙන් න්‍යායික පදනමක් සහිත ක්‍රියාවලියක් වශයෙන් ගොඩනැඟී ගිය අතර, එය වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනිවාර්ය හා අද්විතීය ස්ථානයක් ද හිමි කරගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ද ගතානුගතික ව පරිණාමයට පත්වෙමින් පැවති විෂය මාලා ව, පසුගිය දශක දෙකක පමණ කාලයක සිට බටහිර රටවල විෂය මාලා සංවර්ධන ප්‍රයත්නයන්හි ආභාෂයෙන් මෙන් ම, ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික බලපෑම් නිසා ද සවිඥානක ප්‍රතිසංවිධානයන් ට භාජනය වෙමින් පවතී.

එම විෂය මාලා සංවර්ධන ප්‍රයත්නයන් වෙනත් රටවල එ බඳු ප්‍රයත්නයන් ද සමග සාපේක්ෂ වශයෙන් සලකා බලමින් විමසුමකට භාජනය කිරීම වැදගත් ය, යන අදහස මෙම අධ්‍යයනයේ පදනම විය.

විධිමත් අධ්‍යාපන පද්ධතියේ විවිධ මට්ටම් තුළ මෙ රට විෂය මාලා සංවර්ධන වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක වී ඇත. එහෙත් විස්තීර්ණ වශයෙන් එම කාර්යය සිදු වී ඇත්තේ කණිෂ්ඨ ද්විතීයික මට්ටම හා සම්බන්ධයෙනි. එමනිසා මෙම අධ්‍යයනයේ දී එකී මට්ටමේ විෂය මාලා සංවර්ධන ව්‍යාපෘති අවධාරණය කැරිනි.

මෙම අධ්‍යයනයේ පසුබිම වශයෙන්, අතීතයේ සිට මෑත භාගය දක්වා ද්විතීයික මට්ටමේ විෂය මාලා පරිණාමය පිළිබඳ විමසුමක් ආරම්භයේ දී කර ඇත. විෂය මාලා සංවර්ධන ව්‍යාපෘති විමසුමක දී න්‍යායික පදනමක අවශ්‍යතාවය පෙනී ගියෙන් ඒ සඳහා ආධාර කරගත හැකි නිර්ණායක පද්ධතියක් ගොඩනගා ගැනීම ඊළඟ ප්‍රයත්නය විය. මේ සඳහා පසුගිය කාලය මුළුල්ලේ දියත් කරන ලද විවිධ විෂය මාලා සංවර්ධන ප්‍රයත්නයන් නියෝජනය කෙරෙන ව්‍යාපෘති කීපයක් ගැන ද විෂය මාලා සංවර්ධන කාර්යය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විකාශනය වූ ආකාරය ගැන ද විමසීමට සිදු විය. එහි ප්‍රතිඵල වශයෙන් විෂය මාලා සංවර්ධනය නමැති අධ්‍යයනාංශය තුළ දැනට ගොඩනැගී ඇති සංකල්ප, විවිධ ව්‍යූහයන් හා ක්‍රම ශිල්ප ද විෂය මාලා සංවර්ධන ව්‍යාපෘති විමසීම සඳහා යොදාගත හැකි නිර්ණායකයන් ද හඳුනා ගැනීමට හැකි විය. එසේ ම, විෂය මාලා සංවර්ධන ව්‍යාපෘති අතර විවිධත්වයක් ඇතත් එ තුළින් පැන නැගෙන යම් රටාවක් ද ඇති බව පෙනී ගියේය. මෙම රටාව විෂය මාලා සංවර්ධන ව්‍යාපෘතියක වැදගත් ම ලක්ෂණය වන අතර, යම් නිර්ණායක පද්ධතියක් මත පිහිටා විෂය මාලා සංවර්ධන ප්‍රයත්නයක් විමසා බැලූ විට එම රටාව හඳුනා ගත හැකි බව ද පෙනුනි. එමනිසා ශ්‍රී ලංකාවේ විෂය මාලා සංවර්ධන ප්‍රයත්න තුළින් මතුවන රටා ලක්ෂණ සෙවීමේ න්‍යායික පදනම වශයෙන්, ඉහත හඳුනාගත් සංකල්පමය සාධක සංවිධානය කිරීමෙන්, නිර්ණායක පද්ධතියක් ගොඩනගා ගන්නා ලදි.

මෙම නිර්ණායක පද්ධතිය භාවිතා කරමින්, මෙ රට ජාතික මට්ටමේ ප්‍රථම සවිඥානක විෂය මාලා සංවර්ධන ව්‍යාපෘතිය ලෙස සැලකිය හැකි 1963 අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විද්‍යා විෂය මාලා සංශෝධන වැඩ පිළිවෙල ප්‍රථමයෙන් විමසුමට භාජනය කොට, එ තුළින් මතුවන රටා ලක්ෂණ හඳුනා ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ මේ දක්වා ක්‍රියාත්මක වී ඇති සවිඥානක විෂය මාලා සංවර්ධන වැඩ පිළිවෙලේ ප්‍රබලතම ප්‍රයත්නය වශයෙන් සැලකෙන 1972 ව්‍යාපෘතිය, මෙම අධ්‍යයනයේ දී අවධාරණය කරන ලදී. මෙය, ඒ අවධියේ කඩිනම් වැඩ පිළිවෙලක් වශයෙන් දියත් කිරීමට හේතු සාධක ප්‍රථමයෙන් විමසා බැලීම. ඉන්පසු එහි කැපී පෙනෙන ලක්ෂණ හා ස්වභාවය ද අධ්‍යයනය කරන ලදින් එය, නිර්ණායක පද්ධතියේ සැලසුම් අවස්ථාව හා කෙබඳු සම්බන්ධතාවයක් පවත්වන්නේදැයි විමසීම ට ආධාර විය. දෙවනුව, මෙම ව්‍යාපෘතිය නිර්ණායක පද්ධතියේ වෙනත් අවශ්‍යතාවයන් කෙතෙක් දුරට සම්පූර්ණ කරන ලද්දේ දැයි පුළුල් වශයෙන් විමසුමට ලක් කරන ලද අතර, ඒ තුළින් මෙහි රටාව හඳුනාගත හැකි විය. ඒ සමග ම ක්‍රියාත්මක අවස්ථාවේ සාර්ථක අසාර්ථක භාවය ද පෙනී ගියෙන්, අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ අනාගත විෂය මාලා සංවර්ධන කාර්යයේ යෙදෙන්නවුන් ගේ අවධානය යොමු වියයුතු අංශ කීපයක් ද මතුකර ගැනීමට හැකි විය.